**ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය**

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය**

**ආර්ථික විද්‍යාව II – 13 ශ්‍රේණිය**

**දෙවන වාර පරීක්ෂණය- 2019**

| 21 | S | II |
|---|---|---|

කාලය පැය 3

**උපදෙස් :-**

**"අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද "ආ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**"අ" උප කොටස**

මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගන්න.

01. i) සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමේ දී වෙළඳපොළ ආර්ථික ක්‍රමය සෑමවිටම සමත්වේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල:4)

ii) ආර්ථික විද්‍යාවට අනුව ප්‍රාග්ධනය නිර්වචනය කර ප්‍රාග්ධන සම්පාදන මූලාශ්‍ර වර්ග කර දක්වන්න. (ල:4)

iii) පහත සිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් නිරූපණය කරන්න. (ල:4)

a. සමාහාර ඉල්ලුම සංකෝචනය වීම නිසා කර්මාන්තශාලා කීපයක සේවක කප්පාදුවක් සිදු කිරීම.
b. සංචාරක කර්මාන්තය සඳහා කෙරෙන විදේශ ආයෝජන ශීඝ්‍රයෙන් ඉහළයාම.
c. නියඟයක් නිසා කෘෂි නිමැවුම පහත වැටීම.
d. යුද්ධයක් නිසා යටිතල පහසුකම් විනාශ වීම.

iv) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ ක්‍රමයක් ලෙස වෙළඳපොළ ආර්ථිකය ප්‍රශස්ථ නොවන්නේ කවර තත්වයන් යටතේ ද? (ල:4)

v) ආවස්ථික පිරිවැයක් සහිතව හෝ රහිතව නිෂ්පාදන ක්‍රියාවලියට සම්පත් උපයෝජනය කළ හැකිද? සුදුසු රූප සටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර විග්‍රහ කරන්න. (ල:4)

02. i) මිල අඩුවීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය පැහැදිලි කරන්න. (ල:4)

ii) අධි ඉල්ලුම් සුදුසු ප්‍රස්ථාර සටහනකින් දක්වන්න. අධි ඉල්ලුමක් පවතින විට සමතුලිත මිල තීරණය වීමට වෙළඳපොළ බලවේග ක්‍රියාත්මක වන ආකාරය ඔබගේ රූප සටහනකින් පැහැදිලි කරන්න. (ල:4)

iii) පහත දැක්වෙන්නේ එක්තරා භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණය වේ.

$$Qd = 60-4P$$

$$Qs = -12+4P$$

a. සමීකරණ විසඳා සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ල:2)
b. සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ල:2)

iv) පහත සඳහන් ප්‍රකාශ මගින් දැක්වෙන භාණ්ඩ ප්‍රභේද නම් කරන්න. (ල:4)

a. ආදායම් ඉල්ලුම් නම්‍යතාව එකට අඩු අගයක් ගන්නා භාණ්ඩ
b. ආදායම් ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි අගයක් ගන්නා භාණ්ඩ
c. හරස් ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගන්නා භාණ්ඩ
d. හරස් ඉල්ලුම් නම්‍යතාව සෘණ අගයක් ගන්නා භාණ්ඩ

v) ඉල්ලුම් නීතිය හා ඉල්ලුම් න්‍යාය අතර වෙනස පැහැදිලි කරන්න. (ල:4)

03. i) කිසියම් භාණ්ඩයක් සඳහා ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 1200-20P$$

$$Qs = 20P$$

මෙම භාණ්ඩය සඳහා රජය විසින් රු.50 ක සහතික මිලක් සමඟ අතිරික්තය මිල දී ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ යැයි සිතන්න. ඒ අනුව පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

a. සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය (ල:2 )
b. රජය විසින් අතිරික්තය මිල දී ගනු ලැබුවහොත් පාරිභෝගික පැහැදම හා ව්‍යාපාරික අයභාරය (ල:2)
c. පාරිභෝගික අතිරික්තයේ වෙනස්වීම (ල:2)

d. නිෂ්පාදන අතිරික්තයේ වෙනස්වීම (ල:2)

e. අතිරික්තය මිල දී ගැනීමේ දී ආණ්ඩුවට දැරීමට සිදුවන පිරිවැය

f. රජය විසින් සහතික මිල නියම කිරීම නිසා අහිමි වී යන සමාජ ශුභසාධනයේ වටිනාකම (ල:2)

ii) රජය විසින් නිෂ්පාදකයින්ට ඒකක බද්දක් පැනවූ පසු පාරිභෝගික අතිරික්තයට, නිෂ්පාදන අතිරික්තයට, සමාජ ශුභ සාධනයට, රජයේ ආදායමට ඇතිවන බලපෑම කුමක්ද? (ල:4)

iii) රජය විසින් නිෂ්පාදකයින්ට ඒකක සහනාධාරයක් ලබාදුන් පසු නිෂ්පාදකයින්ට වැඩි වාසියක් ද? පාරිභෝගිකයින්ට වැඩි වාසියක් ද අත්වන්නේ කුමන ඉල්ලුම් හා සැපයුම් නම්‍යතා යටතේ ද? යන්න ලියා දක්වන්න. (ල:4)

04. i) කෙටිකාලය හා දිගුකාලය අතර වෙනස දක්වන්න. (ල:4)

ii) පූර්ණ තරඟකාරී වෙළඳ පොළ හා ඒකාධිකාරී තරඟ වෙළඳපොළ ව්‍යුහ සංසන්දනය කරන්න. (ල:4)

iii) පූර්ණ තරඟකාරී වෙළඳපොළක කෙටිකාලීන හැසිරීම ආන්තික අයභාර හා ආන්තික පිරිවැය ප්‍රවේශය ඔස්සේ පැහැදිලි කරන්න. (ල:4)

iv) පහත සඳහන් සංකල්ප අතර වෙනස දක්වන්න.

a. ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය

b. ප්‍රාමාණික ලාභය හා ආර්ථික ලාභය (ල:4)

v) හීන වන ඵල හා අඩුවන පරිමාණානුකූල ඵල අතර වෙනස දක්වන්න. (ල:4)

05. i) කිසියම් ආර්ථිකයක් සම්බන්ධ පහත තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| ආන්තික පරිභෝජන නැමියාව | 0.75 |
| ආයෝජනය | 225 |
| ස්වාධීන පරිභෝජනය | 150 |

a. සමතුලිත නිමැවුම ගණනය කරන්න. (ල:2)

b. සමස්ත වියදම, සමස්ත කාන්දුවීම් හා සමස්ත විදීම් රේඛා ප්‍රස්ථාරයක දක්වන්න. (ල:2)

c. මෙම ආර්ථිකයට රජය මැදිහත් වී රුපියල් මිලියන 40 ක භාණ්ඩ හා සේවා මිල දී ගනී. එසේම කුටුම්භ සංක්‍රාම ලෙස රුපියල් මිලියන 40 ක් ලබාදෙන අතර රුපියල් මිලියන 60 ක ස්වාධීන බද්දක් අය කරනු ලබයි.

i. නව සමතුලිතය පෙන්වන්න. (ල:2)

ii. එම අවස්ථාවේ ආර්ථිකයේ කාන්දුවීම් විදීම්වලට සමාන බව පෙන්වන්න. (ල:2)

ii) එක්තරා ආර්ථිකයක් සම්බන්ධ පහත සඳහන් තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| සේවක ආදායම් | 2000 |
| මෙහෙයුම් අතිරික්තය | 2500 |
| මිශ්‍ර ආදායම් | 3000 |
| නිෂ්පාදන මත ශුද්ධ බදු | 500 |
| නොබෙදූ ලාභ | 250 |
| සාංගමික ආදායම් බදු | 100 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | 200 |
| විදේශ ශුද්ධ සංක්‍රාම | 150 |
| කුටුම්භ ආදායම් බදු | 50 |
| ශුද්ධ වක්‍ර බදු | 30 |
| කුටුම්භ සංක්‍රාම | 20 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

a. දළ දේශීය නිෂ්පාදිතය (ල:4)

b. දළ ජාතික නිෂ්පාදිතය (ල:2)

c. වැය කළ හැකි දළජාතික ආදායම (ල:4)

d. කුටුම්භ ආදායම (ල:2)

e. වැයකළ හැකි කුටුම්භ ආදායම (ල:2)

## "ආ" උප කොටස

06\. i) උද්ධමනයක් ආර්ථිකයේ විවිධ අංශ කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල:4)

ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් මොනවාද?

iii) පහත තොරතුරු උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | |
|---|---|
| මහජනයා සතු ව්‍යවහාර මුදල් | රු. බිලියන 200 |
| වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | රු. බිලියන 160 |
| මහබැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු | රු. බිලියන 140 |
| මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | රු. බිලියන 150 |
| මහජනයා සතු වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු | රු. බිලියන 500 |
| අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු | රු. බිලියන 100 |
| අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති නේවාසික තැන්පතු | රු. බිලියන 100 |

a. පදනම් මුදල් (ල:2)

b. පටු මුදල් සැපයුම (ල:2)

c. පුළුල් මුදල් සැපයුම (ල:2)

d. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (ල:2)

e. මුදල් ගුණකය (ල:2)

iv) මුදල් ඉල්ලුම තීරණය කරන සාධක දක්වන්න. (ල:2)

07\. i) පූර්ණ මුදල් මැවීමක් සඳහා පැවතිය යුතු උපකල්පන දක්වන්න. (ල:4)

ii) මුදලේ සංසරණ ප්‍රවේගයේ වැදගත්කම දක්වන්න. (ල:4)

iii) විවට වෙළඳපොළ කටයුතු මුදල් සැපයුමට බලපාන ආකාරය දක්වන්න. (ල:4)

iv) පුද්ගලයෙකු වාණිජ බැංකු ගණනාවකින් සමන්විත බැංකු පද්ධතියක එක්තරා වාණිජ බැංකුවක රුපියල් 100,000.00 ක් තැන්පත් කලේය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 5% නම් මෙම බැංකුවට අදාල තැන්පතුව නිසා අමතර උපරිම වශයෙන් කොපමණ මුදලක් ණයට ලබාදිය හැකිද? (ල:4)

v) මහබැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ සඵලතාව සීමා කරන සාධක දක්වන්න. (ල:4)

08\. i) වෙළඳපොළ අසාර්ථකවීම යන්නෙන් කුමක් අදහස් වේදැයි දක්වා වෙළඳපොළ අසමත් වීමේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ල:4)

ii) ශුද්ධ පොදු භාණ්ඩ, අර්ධ පොදු භාණ්ඩ, පොදු දේපල සම්පත් හා පෞද්ගලික භාණ්ඩ හඳුන්වන්න. (ල:4)

iii) ධන බාහිරතා පවතින විට වෙළඳපොළ යන්ත්‍රණය ඔස්සේ සිදුවන නිෂ්පාදන හෝ පරිභෝජන මට්ටම් සමාජයීය වශයෙන් ප්‍රශස්ත නොවන ආකාරය සුදුසු ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ල:4)

iv) යහපත් බදු ක්‍රමයක පැවතිය යුතු මූලධර්ම මොනවාද? (ල:4)

v) කාර්යබද්ධ වර්ගීකරණයට අනුව රාජ්‍ය වියදම් වර්ග කර 2017 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් එම රාජ්‍ය වියදම් කොපමණ දැයි දක්වන්න. (ල:4)

09\. i) ආරක්ෂණයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක මොනවාද? (ල:4)

ii) ලංකාවේ හා ඉන්දියාවේ සහල් හා තිරිඟු වල ශ්‍රම පැයක නිමැවුම පහත දැක්වේ.

| | ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | 5 | 15 |
| තිරිඟු | 10 | 10 |

a. එක් එක් භාණ්ඩයට නිරපේක්ෂ වාසි ඇති රට නම් කරන්න. (ල:2)

b. සාපේක්ෂ වාසි මත එකිනෙක රට කුමන භාණ්ඩයට විශේෂිකරණය වන්නේ ද? (ල:4)

c. රටවල් දෙක සතුව ශ්‍රම ඒකක 100 බැගින් ඇතැයි සිතා දෙරටේ නිෂ්පාදන හැකියා වක්‍ර නිර්මාණය කරන්න. (ල:4)

d. රටවල් දෙක අතර බාහිර හුවමාරු අනුපාතය දක්වන්න. (ල:2)

e. දෙරට අතර 1:1 අනුපාතයට හුවමාරුවන්නේ යැයි සිතා පරිභෝජන වක්‍ර නිර්මාණය කන්න. (ල:4)

10. i) නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය අතර වෙනස දක්වන්න. (ල:4)

ii) ගෙවුම් තුලන ලේඛනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි දක්වා මූල්‍ය ගිණුමේ ඇතුලත් සංවරක දක්වන්න. (ල:4)

iii) ගෙවුම් ශේෂයේ දීර්ඝකාලීන හිඟයකට ඉදිරිපත් කළහැකි විසදුම් මොනවාද? (ල:4)

iv) රටක විදේශ වත්කම් අඩුවීමේ ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න. (ල:4)

v) විදේශ සම්පත් පරතරය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ල:4)